හඳ දිදුන මතක සුමඳ

25

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට

"මාස්ටර්" තරමක් තලතුනා දෙදරා පියෙකි. මේ තලතුනා බව ප්‍රකට වූයේ ඔහුගේ වයසින් නොව උපශාන්ත හැසිරීමෙනි. ලංකාවේදී ගුරුවෘත්තියේ යෙදී ඇති මාස්ටර් ඉංග්‍රීසි ප්‍රංශ භාෂා දෙකම හැසිරවිය හැකි උගතෙකු සේ සැලකිණ. මාස්ටරත්, අභයගුණත් පදිංචිව උන්නේ එකම ගෙයක් දෙකට බෙදාගෙන ගෙවල් කුලිය සමසේ ගෙවමිනි. මෙම නිවසේ අයිතිකරුවා වූයේ ඥානපාල ය.

මාස්ටර් පක්ෂයට ළැදිව උන්නෙකි. ලංකාවේදී ඔහු පක්ෂයට සම්බන්ධ වී සිටි බවද ප්‍රකාශකර තිබුණි. එතේ මා කෙතෙක් උත්සාහ කළද ඔහු පක්ෂයට සම්බන්ධ වී සිටියේ කොයි ආකාරයෙන්දැයි දැනගත හැකි නොවී ය. "ඔබ ලංකා ගුරු සංගමයේ සිටියේදැයි" ? මා විසිතිම විමසූ කල ඔහු එසේ යැයි පවසී ය. මාස්ටර් තරමක ගුප්ත චරිතයක් සේ හැඟීගියේ ඔහුගේ ඇතැම් ගතිගුණ නිසාම නෙවේ. අනුන් පවසන දේ සිනා සිසී අසා සිටිනවා මිස ඔහුගේ අදහස් කිසිම විටක හෙළිදරව් නොකළ නිසාවෙනි.

තරමක අලස පුද්ගලයෙ වූ මාස්ටර් රැකියාව වශයෙන් කළේ දේශපාලන රැකවරණ ඉල්ලුම් කරන්නන්ට ධගජගජගෂාග් වට (දේශපාලන රැකවරණ ලබාදෙන ආයතය) ඉදරිපත් කිරීම සඳහා කථාවක් නිර්මාණය කර එය ප්‍රංශ භාෂාවෙන් ලියාදීම ය. එයින් ඔහුට තරමක ආදායමක් ලැබුණි. මගේ සිතුවිල්ල වැරදි වුව නිවැරදි වුව පසුව මට හැඟීගියේ මාස්ටර් පක්ෂයේ කෙනෙකු ලෙස පෙනී සිටින්නේ කරුණු දෙකක් සඳහා බවය. පළමුවැන්න පක්ෂයට සමීප සිටිමෙන් ධගජගජගෂාග්ග වට ලිවිය යුතු කථා පුවත්පත්වලට පක්ෂයේ දේශපාලනයට අදාළ අමුද්‍රව්‍ය එක්රැස් කරගැනීමට අවස්ථාව ලැබෙයි. දෙවැන්න ඔහු ජේ.වී.පියට සම්බන්ධ පුද්ගලයෙකු ලෙස ප්‍රචාරය වූ විට ඔහු ලියා ඉදරිපත් කරන කථාවලට දේශපාලන රැකවරණ ලැබෙයැයි එම අයැදුම් කරුවන් අතර විශ්වාසයක් ඇතිවීම ය. මාස්ටර් පක්ෂයේ සිටි පුද්ගලයෙකු නොවෙතැයි මට සැකයක් ඇතිවූයේ අහේතුකවම නොවේ. ඔහු ධගජගජගෂාග් ග වට ලියූ එක්තරා කථාවක් දැකීමෙනි.

යම් පුද්ගලයෙකු කලක් ජ.වි.පෙ. සිට ඉන් ඉවත්ව ගිය නිසා ජ.වි.පෙ. ඔහු ඝාතනය කිරීමට උත්සාහ දරන බැවින් හෙතෙමේ ජීවිතාරක්ෂාව පතා ප්‍රංශයට පලා ආ බව එම කථා පුවතයි. පක්ෂයට හදවතින්ම ආදරය කරන්නෙකුට පක්ෂයට එවැනි හිගරුවක් කළ හැකිද?

දසරත්න අභයගුණගේ කුලුපග මිත්‍රයෙකි. ප්‍රසන්න පෙනුමැති කඩවසම් පුද්ගලයෙකි. ඔහු මා බලන්නට පැමිණියේ මට ත්‍යාගයක් ද රැගෙන ය. එය කොළ පැහැති පුල්ඕවරයකි. වර්ණයක් වශයෙන් එය මගේ සිත්ගත් වර්ණයකි.

ප්‍රංශයට පැමිණෙන සංක්‍රමණිකයෙකු පැරිසියේ ප්‍රධාන පොලිසියට ගොස් තාවකාලික පදිංචි බලපත්‍රයක් ලබා ගැනීම සඳහා පදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. මා අභයගුණ සමග මාස දෙකකට ආසන්න කාලයක් සිටියද වසර දෙකක තියේසේ මට පදිංචි සහතිකය දුන්නේ දසරත්න ය. දසරත්න අභයගුණ සමග එක්වී පක්ෂයේ මතවාදය වෙනුවෙන් පෙනීසිටි තිබේ. ලංකාවේ දියත්වන දේශප්‍රේමී අරගලයට අධාර කිරීම පිණිස "නන්දා මාලිනිය" ගේ 'පවන' ප්‍රසංගය පැරිසියට ගෙන්වා ඇත්තේ දසරත්නගේ හා අභයගුණගේ මැදිහත්වීමෙනි. දේශප්‍රේමේන් හා විප්ලවාදීන් එක්තරා කාලයකදී මේ ගායිකාව ගැන සිතුවේ විප්ලවවාදී ගායකයා වූ 'වික්ටර් හාරා' ගැන සිතන ආකාරයෙනි. විරෝධාකල්පවලින් සමන්විත ඇයගේ පවන ප්‍රසංගය පැවැත්වීම වුව විප්ලවවාදී ක්‍රියාවක් ලෙස ඇතැමුන් සිතූහ. (සංගීතය හා ගායනය අතින් ප්‍රබුද්ධ මට්ටමක සිටින මේ ගායිකාවගේ අතැම් ක්‍රියාකලාපයන් හා අවංක බව කොයි තරම් ප්‍රබුද්ධදැයි වෙනම විමසා බැලිය යුත්තකි.) ශාලාව උතුරන්නට සෙනඟ පැමිණි ප්‍රංශයේ පවත්වන සාර්ථකම හා වැඩිම ආදායම් ලැබූ ප්‍රසංගය 'පවන' යයි ඇතැමුන් අද පවා පවසති.

අභයගුණගේ මිත්‍රයෙකු ලෙස අප උන් නිවසට ආ ගිය පක්ෂයේ හිතවතෙකු වූයේ කුලතුංග ය. ඔහු පක්ෂයේ පූර්ණකාලීනව වැඩකර ඇති සහෝදරයෙකි. අභයගුණ නිසා මට හමුවූ පුද්ගලයන් අතුරින් දේශපාලනය ගැන දැනුමක් තිබුණේ නම් කුලතුංගට පමණි. ඔහුගේ හැසිරීම, හැඳියාව හා විනය ඔහු පක්ෂයේ සිටියේය යන්න මට පෙන්වා දුන් නොදම සාක්ෂිය විය. එම අවස්ථාව වන විට කුලේට තිබූ ලොකුම ප්‍රශ්නයක් වූයේ ස්ථිර වීසා බලපත්‍රයක් නොමැතිකම ය. ධගජගජගෂාග්ග වෙන් ඔහුගේ දේශපාලන රැකවරණ අයැදුම්පත ප්‍රතික්ෂේප වී කොමිසමට අපපැලක් ඉදිරිපත් කළ පසු එයද ප්‍රතික්ෂේපව තිබුණි. අළුත් ලියකියවිලි හා සාක්ෂි මත නවත වතාවක් ධගජගජගෂාග්ග වෙන් අයැදුම් කළහැකි නිසා පක්ෂයේ ලන්ඩන් ශාඛාවෙන් සහතිකයක් ලබාගෙන නැවත ඉල්ලුම් කරන්නැයි මම ඔහුට පැවසීමි.

"සහෝදරයා, මම පක්ෂයේ ෆුල්ටයිම් වැඩකරපු බව ඇත්ත. ඒත් මම ප්‍රංශෙට ආවේ මට දේශපාලන තර්ජන එන්න කලින්. ඔහේලා වධ කරන ලද දීර්ඝ කථාන්දරයකට පසුව ඔවුහු පවසන ලද්දේ එම හිමිනම තව දුරටත් හික්ෂුවක් නොවන බවත්, ඔහු සිවුරුවල පැහැයෙන්ම යුතු කලිසමක් හා කුරුතාවක් වැනි පන්ජාබි පන්නයේ අමුතුම ඇඳුමකින් සැරසී විහාරස්ථානයක නොව පුද්ගලික නවාතනැක ගිහි ජීවිතයක් ගත කරමින් සිටිනා බවත්ය. මේ තොරතුරුවලට සවන් දීමෙන් පසු මේ හිමිනම මුනගැසී කථාබස් කිරීමට මට ඇතිවූයේ බලවත් ආශාවකි. මගේ ආශාව මගේ හිතවතුන්ට පැවසූ විට ඔවුහු එයට අකමැත්ත පළකළා පමණක් නොව ඒ සඳහා කිසිදු හෝඩුවාවක් නොසැපයීමට ද වගබලා ගත්තෝ ය.

ස්ථිර වීසා බලපත්‍රයක් නොමැතිව පැරිසියේ රැඳී සිටින්නට සිදු වූ මේ සොයුරා, වෙනත් කාරණයකට ඔහු පදිංචිව සිටි ගොඩනැගිල්ලට පොලිසියෙන් ආ මොහොතක බිය පත් වී පලායාම සඳහා ඉහළ මහලකින් බිමට පැනීම නිසා දෙපා බිඳී අබිබගාතයෙකු වීලු.

1989 නොවැ 13 වන දා විජේවීර මහා දමන්නට පැය කීපයකට පෙර

විදලා පණ බේරගෙන ආපු විදියට මම පක්ෂයෙන් ඉල්ලීමක් අරගෙන දේශපාලන රැකවරණ ඉල්ලන එක සාධාරණ නෑ."

"එහෙම කියන්න එපා කුලතුංග සහෝදරයා. යූ.ඇන්.පී. ශ්‍රී ලංකා කරපු මිනිස්සු ජේ.වී.පී. එකට හතුරුකම් කරපු අයෝ, දේශපාලනය කියන එකේ 'අ' යන්නවත් නොදන්නා හාල්පාරුවෝ පක්ෂයේ නම් වික්‍රුණාලා ඕන තරම් දේශපාලන රැකවරණ අරගෙන තියෙන්නේ. ඉතින් පක්ෂයේ ගිටපු ඔයා ගත්තම මොකද? මම ලන්ඩන්වලට කියන්නම් ඔයාට සහතිකයක් එවන්න කියලා.

"එපා එපා සහෝදරයා මට ඒක කරන්න බෑ" මගේ යෝජනාවට කුලතුංග කෙසේවත් එකඟ වූයේ නැත.

මා ලංකාවේ සිටියදී මට ලිපි එවන අභයගුණ පක්ෂයේ වැඩ කටයුතුවලට සම්බන්ධ වී සිටි හික්ෂුවක් ගැන විවිධ හා විචිත්‍ර තොරතුරු මට ලියා එවී ය. ලංකාවේ සිටියදී වුව මා තේරුම් ගත්තේ පැරිසියේ සිටින පක්ෂයේ හිතවතුන් කල්ලි කිහිපයකට බෙදී, වෙන වෙන කුඩා කණ්ඩායම් ලෙස ගොනු වී හිඳිනා බවය. ප්‍රංශයට පා තැබීමෙන් පසුව මගේ ප්‍රධාන හිතවතුන් තිදෙනා ලෙස මට සැලකීමට සිදුවූයේ අභයගුණ, ඥානපාල හා දසරත්න ය. ඔවුන් තිදෙනාම මේ හිමිනම සම්බන්ධයෙන් දැක්වූයේ බලවත් විරෝධතාවකි. ඔවුන් පැවසූ තොරතුරුවලට අනුව එම හිමිනම පක්ෂයේ වැඩකර ඇත්තේ එතුමාට හිතවත් කණ්ඩායමක් සමගිනි. එහි ප්‍රධානියා 'පෙත්තා' නැමැත්තෙකි. එම හිමිනම පවසා ඇත්තේ තමා වැඩ කරන්නේ ලංකාවේ සිටින සිරි අයියාගෙන් (සෝමවංශ අමරසිංහ සහෝදරයාගෙන්) ලැබෙන උපදෙස් අනුව බවකි. 1987 වර්ෂයේදී, පක්ෂයේ වැඩ කිරීම සඳහා මා ප්‍රංශයට ගෙන්වා ගතයුතු යැයි යන යෝජනාවක් අභයගුණ හා ඥානපාල විසින් ඉදිරිපත් කළ අවස්ථාවක කුපිත වූ මේ හික්ෂුව, "හා හා ඔය හදන්නේ මාතර බලය ගොඩ නගන්න නේද" යි සිය විරෝධය පළ කළේලු. අභයගුණ, ඥානපාල හා දසරත්න විසින් මට විස්තර කරන ලද දීර්ඝ කථාන්දරයකට පසුව ඔවුහු පවසන ලද්දේ එම හිමිනම තව දුරටත් හික්ෂුවක් නොවන බවත්, ඔහු සිවුරුවල පැහැයෙන්ම යුතු කලිසමක් හා කුරුතාවක් වැනි පන්ජාබි පන්නයේ අමුතුම ඇඳුමකින් සැරසී විහාරස්ථානයක නොව පුද්ගලික නවාතනැක ගිහි ජීවිතයක් ගත කරමින් සිටිනා බවත්ය. මේ තොරතුරුවලට සවන් දීමෙන් පසු මේ හිමිනම මුනගැසී කථාබස් කිරීමට මට ඇතිවූයේ බලවත් ආශාවකි. මගේ ආශාව මගේ හිතවතුන්ට පැවසූ විට ඔවුහු එයට අකමැත්ත පළකළා පමණක් නොව ඒ සඳහා කිසිදු හෝඩුවාවක් නොසැපයීමට ද වගබලා ගත්තෝ ය.

ප්‍රංශයට පැමිණි මාසයකට පමණ පසු මා 'ඔපෙරා' උමං දුම්රිය පොළ තුළ මෙත්රෝවක් (උමං දුම්රියක්) එනතුරු හිඳින කල මගේ නෙත ගැටුණේ අභයගුණලා පැවසූ ඇකාරයේ ඇඳුමක් ඇඳ, ජපන් හාමුදුරුවරු උරයේ එල්ලා ගෙන යන වර්ගයේ රෙදි මල්ලක් ඉල්ලාගෙන යන මුහු හිසක් යයි සැලකිය හැකි හිසක් සහිත පුද්ගලයෙකි. වහාම ඔහු අභියසට ගිය මම ඔබ අසුවුල් හිමිනම දැයි විමසීමි. ඉන් අනතුරුව අප අතර ඇතිවූයේ පැයක පමණ සාකච්ඡාවකි. එතුමා අභයගුණ ඥානපාල හා දසරත්න යන තිදෙනාටම තදින්ම දොස් පැවරී ය.

'අන්තිම දුෂ්ට, අසත්පුරුෂ, මොළේ කළඳක් නැති මෝඩයෝ තුන් දෙනෙක්. මහත්තයා පුළුවන් තරම් ඉක්මනින් ඔය අදහානයෝ ළඟින් ඈත්වෙන්න. ගිටියොත් කිසිම සුගතියක් නෑ. ඉන්දියන් හමුදාව ලංකාවට ඇවිල්ලා අවුරුද්දක් පිරෙන වේලාවේ පැරිසියේ ඉන්දියානු තානාපති කාර්යාලය ඉදිරිපිට මම සංවිධානය කරපු විරෝධතා ව්‍යාපාරයට තමයි මේ පැරිසියේ වැඩිම සෙනඟක් ආවේ. අභයගුණයි, දසරත්නයි 'පවන' ප්‍රසංගයෙන් හොඳ ගණනක් යටිමඩි ගැහුවා. ආයේ දෙකක් නෑ".

එතුමා වක්කඩ කැඩුවාක් මෙන් කියවා ගෙන ගියේ ය. අභයගුණලා ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ප්‍රධාන චෝදනාවේ සත්‍ය තත්ත්වය දැනගනුවස් මම එය පිළිබඳව විමසා සිටියෙමි. එය හික්ෂුවකට අකැප යයි සම්මත, පාරාජිකාවීමක් සේ සලකන එහෙත් මනුෂ්‍යත්වයට පොදු මානුසික ප්‍රශ්නයකි.

"මේ කොමියුනිස්ට්වාදී සහෝදරවරුන්ට ආදරය, සෙනෙහස වගේ මානුෂීය හැඟීම් වටහා ගන්න තරම් සංවේදී බවක් ඇතිය කියලා හිතපු නිසා මම අවංකව අදහස් ප්‍රකාශ කළා. ඊට පස්සේ මගේ වචනම යොදාගෙන එවුන් මට අපහාස කළා'"

අන් කරුණුවල සත්‍ය අසත්‍යතාවය කෙසේ වෙතත් එම අවස්ථාවේ මට තේරුම් ගියේ මේ හිමිනම තරමක් සැර පරුෂ කෙනෙකු බවය. අසුවල් හාමුදුරුවන් හමු වී කථාබහ කළෙමියි මා මිතුරන්ට පැවසූ විට ඔවුන්ගේ මුහුණු හරක් වී ගියේ හමුනොවිය යුතු තැනැත්තා ද මට හමුවී ඇති බැවින් තව දුරටත් මා පරිස්සම් කිරීමේ තේරුමක් නැතුවාක් මෙනි.

පැරිසියේ ජ.වි.පෙ. සංවිධායක යයි කියන තැනැත්තා මා හමුවෙන්නට පැමිණියේ මා ප්‍රංශයට පැමිණ සති දෙකකට පමණ පසුව ය.

"සහෝදරයා ඉන්නේ අභයගුණ ළඟ නිසා මම එන්න හදිසි උනේ නෑ."

ඩේවිඩ්සන් කිව්වේ ය. ඒ වන විට අභයගුණට පක්ෂය සමග යම් සබඳකමක් තිබුණේ නම් මේ ඩේවිඩ්සන් සමග පැවති පුද්ගලික මිත්‍රත්වය පමණකි. ඩේවිඩ්සන් ට ද හිටියේ ඔහු වටා සිටි කුඩා කණ්ඩායමකි. ආර්නෝල්ඩ්, බැස්ටිල්, පැසී, කරු ඔහුගේ කණ්ඩායමට අයත් වූහ.

පක්ෂයේ වැඩ කරන තවත් සහෝදරයෙකු අභයගුණගේ නිවසට ආවේ මාස්ටර් හමුවීය. ඔහු කැමිලෝය. කැමිලෝ යන නම ද ඩේස්ඩ්සන්, ආර්නෝල්ඩ් වැනි ආරඩ තමකි. තානාපති කාර්යාලයක රැකියාව කරන කැමිලෝ ප්‍රියමනාප තරුණයෙකි. ඔහු ජ. වී. පේ. ලන්ඩන් ශාඛාව සමග සබඳතා පවත්වමින් පක්ෂයේ වැඩට උරදෙමින් සිටියේ ය.

පැරිසියේ පක්ෂයේ වැඩ කටයුතුවලට සම්බන්ධව සිටි යම්කිසි බේදවාචකයකට මුහුණදුන් 'නාරංගල' යන සොයුරෙකු සිටියමුත් ඔහු පැරිසිය හැරදා ලංකාවේ පදිංචියට යන තුරුත් මට ඔහු මුණ ගැසීමේ අවස්ථාවක් නොඑළඹිණ. ස්ථිර වීසා බලපත්‍රයක් නොමැතිව පැරිසියේ රැඳී සිටින්නට සිදු වූ මේ සොයුරා, වෙනත් කාරණයකට ඔහු පදිංචිව සිටි ගොඩනැගිල්ලට පොලිසියෙන් ආ මොහොතක බිය පත් වී පලායාම සඳහා ඉහළ මහලකින් බිමට පැනීම නිසා දෙපා බිඳී අබිබගාතයෙකු වීලු.

මිත්‍රපාල හා පුන්සිරි යන සොයුරන් දෙදෙනා මට මුණ ගැසුණේ පැරිසියේ පවත්වන ලද සිංහල අවුරුදු උත්සවය නැරඹීමට ගිය අවස්ථාවක ය.

"සහෝදරයා ප්‍රංශයට ආපු බව අපිට ආරංචි උනා. ඒත් නැවතිලා ඉන්න තැන කට්ටිය එක්ක අපේ ආශ්‍රයක් නැති නිසා බලන්න ආවේ නැහැ."

ඔවුන් දෙදෙනාම පැවසුවේ එසේය. තට්ටය පෑදී ඇති ගිසක් සහිත මිත්‍රපාල ගැන මා ඔහු හමුවෙන්නට පෙර ද අසා තිබුණි. යම්කිසි දේශපාලන දැනුමක් සහිත ඕනෑම තැනකදී පක්ෂය වෙනුවෙන් ආවේගශීලීව පෙනී සිටින බව ද "ජේ. වී. පී. මිත්‍රා" යයි පැවසූ විට පැරිසියේ බොහෝ දෙනෙකු ඔහු ගැන දන්නා බව ද මා අසා දැන සිටියෙමි. එම අවස්ථාවේදී පුන්සිරි සහෝදරයා මට පැවසුවේ මෙවැන්නකි. එය අවංක හා අහිංසක ප්‍රකාශයක් යැයි යන්න මාගේ හැඟීම විය.

"මම නම් සෙහෝදරයා පක්ෂයේ එක පන්තියක්වත් කරලා නෑ. පොත්පත් කියවලා ලොකු දේශපාලන දැනුමකුත් නෑ. මම මේ දේශපාලනය කරන්නේ රට වෙනුවෙන් මැරුව්ව අර අහස් ගණනක් කොල්ලො වෙනුවෙන්"

ළඟන කළාපයට